සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. පිරවුම් හලක QR කේතයක් භාවිතයෙන් ඉන්ධන ලබා ගැනීමට ගිය අවස්ථාවක් සලකන්න. පිරවුම් හල් සේවකයා විසින් පාරිභෝගිකයෙකුගේ QR කේතය තම ජංගම දුරකථනයෙන් සුපරික්ෂණය කර ඔහුගේ කෝටාවට අදාළ ඉන්ධන ප්‍රමාණය පරික්ෂා කර ඉන්ධන ලබාදීම සිදුකරයි. අනතුරුව ලබාදුන් ඉන්ධන ප්‍රමාණය සලකුණු කළ විට පාරිභෝගියාට ලබා දුන් ඉන්ධන ප්‍රමාණය හා ඉතිරි ඉන්ධන ප්‍රමාණය දක්වමින් කෙටිපණිවුඩයක් ලැබුණි. මෙම ක්‍රියාවලියෙහි අඩංගු දත්ත සැකසීමක් ලෙස සැලකිය හැක්කේ පහත පිළිතුරු අතරින් කුමක්ද?
   (1) QR කේතය ජංගම දුරකථනයෙන් සුපරික්ෂණය කිරීම
   (2) දුරකථනයට කෙටි පණිවුඩයක් ලැබීම
   (3) දත්ත සමුදායට පිවිස QR කේතයට අදාළ රෙකෝඩය සොයාගැනීම
   (4) ලබාදුන් ඉන්ධන ප්‍රමාණය සලකුණු කිරීම

02. අන්තර්ජාලය ඔස්සේ සිදුකරනු ලබන මාර්ගගත වීඩියෝ සම්මන්ත්‍රණයකට අත්‍යවශ්‍ය උපාංග පමණක් දැක්වෙන පිළිතුර පහත පිළිතුරු අතරින් කවරක්ද?
   (1) පරිගණකයක්, ජංගම දුරකථනයක්, අන්තර්ජාල සම්බන්ධතාවයක්
   (2) අන්තර්ජාල සම්බන්ධතාවයක්, පරිගණකයක්, මයික්‍රොෆෝනයක්, වෙබ් කැමරාවක්
   (3) මයික්‍රොෆෝනයක්, වෙබ් කැමරාවක්, පරිගණකයක්, ජංගම දුරකථනයක්
   (4) ජංගම දුරකථනයක්, අන්තර්ජාල සම්බන්ධතාවයක්, පරිගණකයක්, මයික්‍රොෆෝනයක්, වෙබ් කැමරාවක්

03. පහත දැක්වෙන පිළිතුරු අතරින් ආදාන උපාංගයකට හෝ ප්‍රතිදාන උපාංගයකට හෝ අයත් නොවන උපාංගය තේරූ විට පිළිතුර කුමක්ද?
   (1) කැතෝඩ කිරණ දර්ශකය (CRT Monitor) (2) ප්‍රධාන මතකය (Main Memory)
   (3) සුපරික්ෂණය (Scanner) (4) ආලෝක පෑන (Light Pen)

04 ඉ-රාජ්‍ය හා සම්බන්ධ පහත සේවාවන් සලකන්න
   A - රාජ්‍ය සේවකයින්ට ණය පහසුකම්
   B - වීසා පහසුකම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
   C - ගැසට් පත්‍ර හා චක්‍රලේඛන
   ඉහත සේවාවන් අතරින් රජය මගින් සේවකයන්ට සැලසෙන සේවාවන් ඇතුළත් පිළිතුර පහත පිළිතුර අතරින් කවරක්ද?
   (1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි (4) A, B, C සියල්ලම

05 එක් තැනක සිට ජාලයකට සම්බන්ධ වී පරිගණක භාවිතා කරනවා වෙනුවට ඕනෑම තැනක සිට අන්තර්ජාලය හා වයර් රහිතව සම්බන්ධ වෙමින් පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි කුඩා පරිගණක භාවිතය සිදුවූවා පමණක් නොව අක්ෂර හා හඬ හඳුනාගැනීමට හැකි පරිගණක ද බිහිවුණි. එසේම කෘතිම බුද්ධිය හා සම්බන්ධ යන්ත්‍ර නිර්මාණය සිදුවූයේද මෙම අවධියේ ය.
   ඉහත ඡේද කණ්ඩය හා ගැලපෙන්නේ පහත දැක්වෙන පරිගණක පරම්පරා අතරින් කවරක් ද?
   (1) පළවෙනි පරම්පරාව (2) හතරවෙනි පරම්පරාව
   (3) තුන්වෙනි පරම්පරාව (4) පස්වෙනි පරම්පරාව

06. පරිගණක පද්ධතියක ඇති ආචායන උපාංග, මධ්‍ය සැකසුම් ඒකකය වෙත ප්‍රවේශ වේගය අනුව ආරෝහණ පිළිවෙළට දැක්වූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

(1) ප්‍රධාන මතකය, වාරක මතකය, රෙජිස්තර මතකය
(2) රෙජිස්තර මතකය , ප්‍රධාන මතකය, වාරක මතකය,
(3) වාරක මතකය, රෙජිස්තර මතකය , ප්‍රධාන මතකය
(4) රෙජිස්තර මතකය, වාරක මතකය, ප්‍රධාන මතකය

07 පරිගණක මධ්‍යගත උපාංගයකට තනි රැහැනක් මගින් සම්බන්ධ කර ඇති නිසා ජාලයේ එක් පරිගණකයක් අකර්මණ්‍ය වුව ද සමස්ථ ජාලයට ඉන් බාධාවක් නොවේ. මෙම ප්‍රකාශය හා ගැලපෙන්නේ පහත කුමන ජාල ස්ථල විද්‍යාවද?

(1) තරු ආකාරය (2) බස් ආකාරය (3) දැල් ආකාරය (4) රුක් ආකාරය

08 BCD ක්‍රමයේදී 803 යන දශමය සංඛ්‍යාව නිරූපණය කරන පිළිතුර වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) $100000100011_{BCD}$ (2) $100000000011_{BCD}$ (3) $100000100111_{BCD}$ (4) $110000100101_{BCD}$

09 ඇස්කි කේත ක්‍රමයේදී C අනුලක්ෂණය ද්වීමය ආකාරයෙන් නිරූපණය කරන්නේ 1000011 ලෙස නම් 1000111 යන ද්වීමය නිරූපණය ඇස්කි කේත ක්‍රමයේ කුමන අනුලක්ෂණය නියෝජනය කරයි ද?

(1) G (2) F (3) E (4) H

10 (A) $A9_{16}$සහ (B) $10011111_2$ යන සංඛ්‍යා දෙක සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත ප්‍රකාශ අතරින් කවරක්ද?

(1) (A) සංඛ්‍යාව (B) සංඛ්‍යාවට වඩා කුඩාවේ (2) (A) සංඛ්‍යාව (B) සංඛ්‍යාවට වඩා විශාලවේ
(3) සංඛ්‍යා දෙකෙහිම අගය සමානවේ (4) සංඛ්‍යා දෙකෙහිම අගය 169 ක් වේ.

11 $255_{\text{දහය}}$ ද්වීමය සංඛ්‍යාවකට පරිවර්තනය කළ විට පිළිතුර කුමක්ද?


(1) $10101010_{\text{දෙක}}$ (2) $11111111_{\text{දෙක}}$ (3) $111001000_{\text{දෙක}}$ (4) $100000000_{\text{දෙක}}$

12 මෙම සත්‍යතා වගුව අයත් වන තාර්කික ද්වාරය වන්නේ කුමක්ද?

(1) AND ද්වාරය
(2) NOR ද්වාරය
(3) NANDද්වාරය
(4) OR ද්වාරය

| Input | | Output |
|---|---|---|
| X | Y | F |
| 0 | 0 | 1 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 0 |

13 පහත දැක්වෙන තාර්කික ද්වාරය සලකන්න. මෙහි A වල අගය 1 වන විට නියත වශයෙන්ම Q ප්‍රතිදානයේ අගය කුමක් විය හැකිද?




(1) O (2) A
(3) B (4) 1

14 පරිගණකයේ ප්‍රධාන ස්වීචය ක්‍රියාත්මක කළ පසු පරිගණකය පණගැන්වීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත දැක්වෙන පිළිතුරු අතරන් කවරක්ද?

(1) බල සැපයුමෙන් පසු ස්වයං පරීක්ෂාව (POST) ක්‍රියාත්මක වී පසුව පද්ධති ගොනු (MBR) සසම්භාවී මතකයට (Main Memory) ගබඩාවේ.
(2) පද්ධති ගොනු (MBR) සසම්භාවී මතකයට (Main Memory) ගබඩා වී බල සැපයුමෙන් පසු ස්වයං පරීක්ෂාව (POST) ක්‍රියාත්මක වේ.
(3) බල සැපයුමෙන් පසු ස්වයං පරීක්ෂාව (POST) හා පද්ධති ගොනු (MBR) සසම්භාවී මතකයට (Main Memory) ගබඩාවීම එකවර සිදුවේ.
(4) බල සැපයුමෙන් පසු ස්වයං පරීක්ෂාව (POST) පමණක් ක්‍රියාත්මක වී පරිගණකය පණගැන්වීම.

15 මෙහෙයුම් පද්ධතියක්, භාෂා පරිවර්තකයක් , උපයෝගීතා මෘදුකාංගයක් පිළිවෙළින් ඇතුළත් වන්නේ පහත දැක්වෙන කවර පිළිතුරේද?

(1) ලිනක්ස් (Linux), සම්පාදක (Compiler), කාර්ය කළමණාකරු (Task Manager)

(2) කාර්ය කළමණාකරු (Task Manager), ලිනක්ස් (Linux), සම්පාදක (Compiler)

(3) වින්ඩෝස් (Windows), කාර්ය කළමණාකරු (Task Manager), අර්ථ විනාශක (Interpreter)

(4) කාර්ය කළමණාකරු (Task Manager) ලිනක්ස් (Linux) , සම්පාදක (Compiler)

16 වදන් සැකසුම් මෘදුකාංගයක අකුරුවල ප්‍රමාණය වෙනස් කිරීම හා ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීම සඳහා භාවිතා කරන පහසුකම් පිළිවෙලින් දැක්වූ විට පිළිතුර කුමක්ද?

(1) Auto Correct & Change Case (2) Formatting & Mail merge

(3) Font Size & Change Case (4) Font Size &Auto correct

17 වදන් සැකසුම් මෘදුකාංගයක වචන ප්‍රතිස්ථාපනයට හා අධිසම්බන්ධකයක් යෙදීමට භාවිතා කරන කෙටිමං යතුරු වන්නේ කුමක්ද?

(1) Ctrl + K සහ Ctrl + H (2) Ctrl + H සහ Ctrl + K

(3) Ctrl + K සහ Ctrl + R (4) Ctrl + R සහ Ctrl + K

18 පහත දැක්වෙන පැතුරුම්පත් සූත්‍ර අතුරින් නිවැරදි සූත්‍ර පමණක් දැක්වෙන පිළිතුර වන්නේ පහත පිළතුරු අතරින් කවරක්ද?

A =MAX (B2:B6) B =MAX (B2:B6, C2,C3:C6)

C =MAX(B2+B3,B4+B5,D6)

(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A, B, C සියල්ලම

19 වදන් සැකසුම් මෘදුකාංග සහ සමර්පන මෘදුකාංග යන දෙවර්ගයෙන්ම ඉටුකළ හැකි කාර්යයක් පමණක් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

(1) වස්තූන් සඳහා සජීවන ලබාදීම (Animation)

(2) තැපැල් මුසුව පහසුකම (Mail Merge)

(3) කදා දර්ශනය කිරීමේ අනුපිළිවෙල සැකසීම (Odering the Slide)

(4) අධිසම්බන්ධක යෙදීම (Hyperlink)

20 පහත දැක්වෙන පැතුරුම්පතෙහි C1 කෝෂයෙහි =A$1*$B1 සූත්‍රය ඇතුලත් කර ඇත. මෙය C3 කෝෂයට පිටපත් කළ විට එහි ඇතුළත් පිළිතුර වන්නේ කුමක්ද?

| | A | B | C |
|---|---|---|---|
| 1 | 5 | 20 | 100 |
| 2 | 6 | 30 | |
| 3 | 7 | 40 | |

(1) 150 (2) 280 (3) 140 (4) 200

21 පහත දැක්වෙන පැතුරුම් පතෙහි C6 කෝෂයේ = COUNT(A2:C2,A3:C3) සූත්‍රය ඇතුළත් කර ඇත්තේ නම් ලැබිය යුතු පිළිතුර වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

| | A | B | C |
|---|---|---|---|
| 1 | 60 | 70 | 25 |
| 2 | 63 | 75 | NO |
| 3 | 65 | 20 | |

(1) 6 (2) 4 (3) 5 (4) 2

පාසලේදී තොරතුරු තාක්ෂණ ගුරුතුමිය ටැබ් පරිගණක බැහැරට දීම සඳහා සකස් කළ දත්ත සමුදායක අඩ වශයෙන් දක්වා ඇති පහත වගු 22 සිට 24 තෙක් ප්‍රශ්න වලට පිළතුරු සැපයීමට භාවිතා කරන්න.

| ටැබ් වගුව-Tab table | | |
|---|---|---|
| **Tab_No** | **Brand** | **Type** |
| T1 | Lenovo | Techer |
| S1 | Lenovo | Student |
| S2 | Asus | Student |
| S3 | Lenovo | Student |

| ගුරු වගුව-Teacher table | | |
|---|---|---|
| **Techer_No** | **Teacher_Name** | **Subject** |
| 0102 | Kelum | Sinhala |
| 0103 | Nayana | History |
| 0104 | Senaviratne | ICT |
| 0105 | Bandara | Science |

| ටැබ්-ගුරු වගුව-Tab_Teacher table | | | |
|---|---|---|---|
| **Tab_No** | **Teacher_No** | **Grade** | **Date** |
| S2 | 0105 | 6A | 2023/08/01 |
| S1 | 0106 | 7B | 2023/08/02 |
| T5 | 0105 | 6A | 2023/08/01 |
| S2 | 0107 | 10B | 2023/08/04 |

22 මෙම දත්ත සමුදායේ දැකිය හැකි ආගන්තුක යතුරු දෙකක් දැක්වෙන පිළිතුර පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) ටැබ්-ගුරු වගුවේ Tab_No හා Grade

(2) ටැබ් වගුවේ Tab_No හා ගුරු වගුවේ Tecaher_No

(3) ගුරු වගුවේ Tecaher_Name හා ටැබ් වගුවේ Tab_No

(4) ටැබ්-ගුරු වගුවේ Tab_No හා Tecaher_Name

23 ටැබ් - ගුරු වගුවේ ක්ෂේත්‍ර ගණන සහ රෙකෝඩ ගණන පිළිවෙලින් දැක්වූ විට පිළිතුර වන්නේ,

(1) 4, 3 (2) 3, 4 (3) 4, 4 (4) 3, 5

24 Kumarasiri නම් නවක ගුරුභවතෙක් S3 නම් ටැබ් පරිගණකය 10 ශ්‍රේණිය ඉගැන්වීම් කටයුතු සඳහා ලබාගත්තේ නම් මේ පිළිබඳව විස්තර තබාගැනීමට කුමන වගුව / වගු යාවත්කාලීන විය යුතු ද?

(1) ටැබ් වගුව (2) ටැබ් වගුව හා ගුරු වගුව

(3) ටැබ්-ගුරු වගුව හා ගුරු වගුව (4) ටැබ්-ගුරු වගුව හා ටැබ් වගුව

25 සම්බන්ධිත දත්ත සමුදායක් සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකන්න. මින් නිවැරදි පිළිතුරු පමණක් ඇති ප්‍රකාශයන් පහත පිළිතුරු අතරින් කවරක්ද?


A දත්ත අනුපිටපත්වීම ඇතිවිය හැකිය.

B දත්ත සමුදායේ කාර්යක්ෂමතාවය වැඩිය.

C දෝෂ සහිත තොරතුරු ලැබීමේ අවදානම අඩුය.

(1) A පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) A, B, C සියල්ලම

26 සමර්පන මෘදුකාංගයක පහත දැක්වෙන මෙවලම් මගින් ඉටු කරන කාර්යයන් පිළිවෙලින් දැක්වූ විට නිවැරදි අනුපිළිවෙල සහිත පිළතුර කුමක්ද?



(1) සාමාන්‍ය දසුන (Normal view), සජීවිකරණය (Animation), කදා සංක්‍රාන්තිය (Slide Transition), කදා දර්ශන දසුන (Slide Show)
(2) සාමාන්‍ය දසුන, කදා සංක්‍රාන්තිය, සජීවිකරණය, කදා දර්ශන දසුන
(3) සජීවිකරණය, කදා දර්ශන දසුන, සාමාන්‍ය දසුන, සජීවිකරණය
(4) කදා දර්ශන දසුන, සජීවිකරණය, කදා සංක්‍රාන්තිය, සාමාන්‍ය දසුන

27 කදා දසුනේ ඊළඟ කදාවට ගමන් කිරීමට පහත සඳහන් කවර ක්‍රියාවන් භාවිතා කළ හැකි වන්නේද?

A Enter යතුර භාවිතා කිරීම
B යතුරු පුවරුවේ N අකුර තද කිරීම
C Page Down යතුර තද කිරීම

(1) A පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) A, B, C සියල්ලම

28 අන්තර්ජාලය හා සම්බන්ධ පහත දක්වා ඇති නියමාවලි විස්තරයට ගැලපෙන නියමාවලීන් සිට D දක්වා ඇති නියමාවලීන් හා ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| නියමාවලි විස්තරය | නියමාවලිය |
|---|---|
| විද්‍යුත් තැපැල් හුවමාරු පාලනය කරයි. | A HTTP |
| වෙබ් අඩවි හුවමාරු පාලනය කරයි. | B ICMP |
| විශාල ප්‍රමාණයේ ගොනු හුවමාරු පාලනය කරයි. | C SMTP |
| දෝෂ පණිවුඩ හුවමාරු පාලනය කරයි. | D FTP |

(1) C, A, B, D (2) C, A, D, B (3) B, D, A, C (4) B, C, D, A


29 පහත දැක්වෙන විද්‍යුත් තැපැල් ලිපින අතරින් දෝෂ සහිතව දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය කුමක්ද?

(1) saman.kumara@gmail.com (2) kelum_23451@hotmail.com
(3) www.pathira_siri.gmail.com (4) nelumKumari75@ymail.com

30 අන්තර්ජාලයේ සේවාදායක පරිගණකයක් තුල සේවාලාභියාට අවශ්‍ය දත්ත ගබඩා කිරීමට අවස්ථාව ලබා දීම හා ඒ හරහා විවිධ සේවාවන් සැපයීම වළාකුළු පරිගණක යටතේ කුමන් සේවාව හා ගැළපේද?

(1) සංවර්ධන පරිසරයන් සපයන සේවාවක් ලෙස (PaaS)
(2) යටිතල පහසුකම් සපයන සේවාවක් ලෙස (laaS)
(3) මෘදුකාංග සේවාවන් සපයන සේවාවක් ලෙස (SaaS)
(4) විවිධ පහසුකම් සපයන සේවාවක් ලෙස (VaaS)

31 පහත දැක්වෙන විශ්ව සම්පත් නිශ්චායකයෙහි A, B, C, D ලෙස නම් කර ඇති කොටස් පිළිවෙළින් දැක්වූ විට නිවැරදි පිළිතුර පහත පිළිතුර අතරින් කවරක්ද ?




(1) වසම් නාමය (Domain Name), ඉහල මට්ටමේ වසම (Top level Domain), සම්පත (Resource), නියමාවලිය (Protocol)
(2) නියමාවලිය, වසම් නාමය, ඉහල මට්ටමේ වසම, සම්පත
(3) නියමාවලිය, ඉහල මට්ටමේ වසම, වසම් නාමය, සම්පත
(4) ඉහල මට්ටමේ වසම, වසම් නාමය, සම්පත, නියමාවලිය

32 පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ නියමුමය පිහිටුවීම (Pilot Deployment) පිළිබඳ නිවැරදිව විස්තර කරන ප්‍රකාශය කුමක්ද?

(1) පැවැති පද්ධතිය හා නව පද්ධතිය දෙකම එකවර නිශ්චිත කාලයක් ක්‍රියාත්මක කිරීම.

(2) කලින් පැවැති පද්ධතිය සම්පූර්ණයෙන් ඉවත් කර නව පද්ධතිය තෝරාගත් කොටසකට පමණක් ස්ථාපනය කිරීම.

(3) කලින් පැවැති පද්ධතිය එසේම තිබියදී නව පද්ධතිය තෝරාගත් කොටසකට පමණක් ස්ථාපනය කර එහි සාර්ථකත්වය බැලීම.

(4) කලින් පැවැති පද්ධතිය එසේම තිබියදී නව පද්ධතිය තෝරාගත් කොටසකට පමණක් අදියරෙන් අදියර ස්ථාපනය කිරීම.

33 පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පද්ධති පරීක්ෂාව යටතේ ආදාන ඇතුළුකර අපේක්ෂිත ප්‍රතිඵල ලැබේද යන්න පරික්ෂා කරන පරීක්ෂණ ක්‍රමය වන්නේ පහත පිළිතුරු අතරින් කවරක්ද?

(1) ඒකක පරීක්ෂාව (2) පද්ධති පරීක්ෂාව

(3) සමස්ත පරීක්ෂාව (4) ප්‍රතිග්‍රහණ පරීක්ෂාව

34 පරිගණක භාෂා සම්බන්ධයෙන් දක්වා ඇති පහත ප්‍රකාශ සලකන්න.

A යන්ත්‍ර භාෂාව ඉංග්‍රීසි භාෂාවේ සරල ඉංග්‍රීසි අකුරු යොදා ගනිමින් ක්‍රම ලේඛනය සිදුකරන භාෂාවකි.

B යන්ත්‍ර භාෂාවෙන් ලියන ලද ක්‍රමලේඛනයක් පරිවර්තනය කිරීම අවශ්‍ය නොවේ.

C ඇසෙම්බ්ලි භාෂාවෙන් ලියන ලද කේත පරිවර්තනයට සම්පාදක යොදාගනී.


D යන්ත්‍ර භාෂාවෙන් ක්‍රමලේඛනයේදී පරිගණක දෘඩාංග පිළිබඳ දැන සිටිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශ/ප්‍රකාශය වන්නේ කුමන පිළිතුරද?

(1) A, B හා D පමණි. (2) A හා D පමණි.

(3) A හා C පමණි. (4) A, B, C, D සියල්ලම

■ **35 සිට 36 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත දැක්වෙන ගැලීම් සටහන යොදාගන්න.**




35 මෙම ගැලීම් සටහන මගින් ප්‍රතිදානය කරන අගය වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(1) 10 (2) 15 (3) 20 (4) 1, 3, 6, 10, 15

36 මෙහි Count=Count+1 වෙනුවට Count=Count+2 ලෙස වෙනස් කළ විට ලැබෙන ප්‍රතිදනය වන්නේ කුමක්ද?

(1) 2, 4 (2) 6 (3) 9 (4) 2,4,9

37 දින 7 ක් තුල පැවැති වර්ෂාපතන අගයයන් K නම් අරාවක පහත ආකාරයට දක්වා ඇත. මින් වැඩිම වර්ෂාපතනය දැක්වෙන්නේ කුමන අරා අවයවයේද?

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 100mm | 90mm | 80mm | 120mm | 200mm | 115mm | 105mm |

(1) K[3] (2) K[4] (3) K[5] (4) K[6]

38 පහත දැක්වෙන පැස්කල් කේතයේ ප්‍රතිදානය කුමක්ද?


```
Program display_num;
        var m:integer;
Begin
        For m := 0 to 4 do
              write(m*5);
        readln;
End.
```

(1) 5, 10, 15, 20 (2) 015101520 (3) 05101520 (4) 0, 5, 10, 15, 20

39 පික්සලයකට බිටු 16 ක් ලබාගන්නා අංකිත ග්‍රාෆිකයක භාවිතා කළ හැකි වර්ණ සංඛ්‍යාව කොපමණද?

(1) 2 x 16 (2) $2^{16}$ (3) 16777216 (4) 255x255

40 පහත වගුවේ A, B, C, D ලෙස දක්වා අත්තේ චිත්‍රක සංස්කරණය කරන මෘදුකාංගයක භාවිතා කරන මෙවලම් කීපයකි.

| | | | |
|---|---|---|---|
|  |  |  |  |
| A | B | C | D |

| අංකය | විස්තරය |
|---|---|
| 1 | ග්‍රාෆිකයක එකම වර්ණයෙන් යුත් එකට යාව පිහිටි කොටස් තෝරා ගැනීම. |
| 2 | එක් ස්ථානය ඇති පික්සල ප්‍රමාණයක් තවත් තැනකට ආදේශ කිරීම. |
| 3 | අවශ්‍ය කොටසක් චතුරස්‍රාකාරව තෝරා ගැනීම. |
| 4 | කැමති හැඩයකට ග්‍රාෆිකයකින් කොටසක් තෝරා ගැනීම. |

ඉහත A සිට D දක්වා මෙවලම් හා වගුවේ දක්වා ඇති ඉටු කරගත හැකි කාර්යයන් හා සැසඳූ විට නිවැරදි පිළිතුර වන්නේ පහත පිළිතුරු අතරින් කවරක්ද?

(1) A-4, B-3, C-1, D-2 (2) A-3, B-3, C-1, D-2

(3) A-1, B-3, C-2, D-1 (4) A-4, B-3, C-2, D-1

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.


---

(01) (i) පළමු පරම්පරාවේ සිට පස්වෙනි පරම්පරාව දක්වා පරිගණකයේ පරිණාමයේදී සිදුවූ සුවිශේෂී වෙනස්කම් 2 ක් ලියන්න (ල. 2)

(ii) (a) අන්තර්ජාලය පදනම් කරගනිමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට ලබා ගත හැකි වාසි 2 ක් ලියන්න. (ල 1)

(b) ඉ-රාජ්‍ය යටතේ ව්‍යාපාරකයින්ට සැලසෙන සේවාවන් 2 ක් ලියන්න (ල. 1)

(iii) A සිට D දක්වා ලේබල කර ඇති පහත සඳහන් කොටු සලකන්න.





පහත දී ඇති ලැයිස්තුව භාවිතා කරමින් ඉහත එක් එක් කෙවෙනිය හඳුනාගෙන කෙවෙනියට අදාළ ලේබලය හා කෙවෙනි නාමය ලියන්න. (ල. 2)

(ලැයිස්තුව :- PS2 කෙවෙනිය, USB, HDMI, VGA)

(iv) (a) 546$_{අට}$ එහි දශමය තුල්‍ය සංඛ්‍යාවට පරිවර්ථනය කරන්න. (ල. 1)

(b) BF9$_{අට}$ එහි ද්වීමය තුල්‍ය සංඛ්‍යවට පරිවර්තනය කරන්න. (ල. 1)

(v) පහත දක්වා ඇති ආර්කික පරිපතයෙහි F සඳහා බූලියානු ප්‍රකාශනය ලියන්න. (ල. 1)




(vi) පහත A සිට D දක්වා ලේබල් කර ඇති මෘදුකාංග වර්ග සලකන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| A | විධාන රේඛා අකුරු මුහුණත් සහිත මෙහෙයුම් පද්ධතියකි. |
| B | උපයෝගිතා මෘදුකාංග (Utility Software) ඝණයට අයත්වේ. |
| C | භාෂා පරිවර්තක මෘදුකාංගයකි. |
| D | විවෘත කේත මෙහෙයුම් පද්ධති මෘදුකාංගකි. |

ඉහත එක් එක් විස්තරයට අදාළ මෘදුකාංගය පහත දැක්වෙන ලැයිස්තුවෙන් හඳුනාගෙන විස්තර ලේබලය හා මෘදුකාංගය ආකාරයට පිළිවෙලින් ලියන්න. (ල. 2)

(සම්පාදක, ප්‍රති වෛරස මෘදුකාංග, Linux , DOS)

(vii) හැඩගන්වන ලද වදන් සැකසුම් පාඨ කොටසක් පහත දැක්වේ.

History of Sri Lanka ← (A)


(B) ↓

Sri Lanka, officially known as the **Democratic Socialist Republic of Sri Lanka**, has a rich and diverse history that spans thousands of years. Here is an overview of key periods and events in Sri Lankan history to 23$^{rd}$ September 2023:

(D) ↑ (points to the superscript "rd")

(C) —
1. Buddhism
2. Ancient kingdom

| P | Q | R | S | T | U |
|---|---|---|---|---|---|



හැඩගන්වන ලද වදන් සැකසුම් පාඨ කොටසේ A සිට D තෙක් ලේබල කර ඇති හැඩගැන්වීම් සඳහා භාවිතා කරන මෙවලම් P සිට U දක්වා දැක්වෙන වගුවෙන් තෝරාගෙන අදාළ අක්ෂර යුගලය ලියන්න. (ල. 2)

(viii) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයට අනුව පද්ධතියක් පිහිටුවීම සඳහා සමාන්තර පිහිටුවීම තෝරාගැනීම මගින් සැලසෙන වාසියක් දක්වන්න.

(ix) සංඛ්‍යා අනුක්‍රමයක් ස්වයංක්‍රීයව නිරූපණය කිරීම සඳහා සකසන ලද පහත ව්‍යාජ කේතය සලකන්න.

```
Begin
  n=1
  do while n<10
      display n
      n = n + 1
  end while
end
```

මෙම ව්‍යාජ කේතය මගින් ලැබෙන ප්‍රතිදානය ලබාගත හැකිවන ලෙස WHILE DO පුනර්කරණ ආකෘතිය භාවිතා කරමින් මීට අදාළ පැස්කල් කේතය ලියන්න.

(x) RGB වර්ණ භාවිතයෙන් තෘතීය වර්ණ සෑදීමේදී භාවිතා කරන ෂඩ්දශමය කේතයක් පහත දැක්වේ. මෙම කේතයට අදාළ රතු කොළ නිල් යන වර්ණ වල දශමය අගයන් ගණනය කර වෙන වෙනම ලියන්න.

#A945A3 RED – .......... GREEN-.........BLUE - ..........

(02) පහත දැක්වෙන්නේ වේරගල මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් පරිගණක ශිෂ්‍ය සමාජය විසින් පවත්වාගෙන යනු ලබන පාසල් කාලයෙන් පසු පැවැත්වෙන පරිගණක පාඨමාලා පිළිබඳව සකස් කර ඇති දත්ත සමුදායක කොටසකි.

ශිෂ්‍ය වගුව (Students Table)- ශිෂ්‍ය සමාජයේ සාමාජිකද නැද්ද යන වග True සහ False මගින් දැක්වේ.

| Student_ID | Student_Name | Grade | ICTClub_Member |
|---|---|---|---|
| ST20 | Menaka | 12 | True |
| ST21 | Gayani | 13 | False |
| ST22 | Nawaz | 11 | True |
| ST23 | Fathima | 12 | True |
| ST24 | Sumandiran | 11 | True |

පාඨමාලා (Course Table) වගුව එක් පාඨමාලාවක් සඳහා උපරිම සිසුන් ගණන 20 කි.

| Course_ID | Name | No of Students |
|---|---|---|
| CS01 | Office Application | 20 |
| CS02 | Graphic Design | 20 |
| CS03 | Computer Hardware | 20 |
| CS04 | Networking | 20 |

ශිෂ්‍ය පාඨමාලා වගුව (student_Course) සිසුන් ලියාපදිංචි වී ඇති පාඨමාලා ඇතුළත් කර ඇත.

| Student ID | Course_ID | Date of Registered |
|---|---|---|
| ST22 | CS04 | 01/03/2023 |
| ST23 | CS02 | 07/03/2023 |
| ST22 | CS02 | 01/03/2023 |
| ST20 | CS01 | 14/03/2023 |

(i) (a) මෙම දත්ත සමුදායේ දැක්වෙන ප්‍රාථමික යතුරු දෙකක් වගුවේ නම් සමඟ ලියා දක්වන්න. (ල. 1 යි)

(b) මෙම දත්ත සමුදායේ පවතින සංයුක්ත යතුරක් වගුවේ නම සමග ලියන්න. (ල.1 යි)

(ii) පහත දැක්වෙන වෙනස්කම් සිදුකිරීමට යාවත්කාලීන කළ යුතු වගුව(වගු) මොනවාද?

(a) ශ්‍රේණියේ ඉගෙනුම ලබන හේෂාන් නම් ශිෂ්‍යයෙක් ICT ශිෂ්‍ය සමාජයේ සාමාජිකත්වය ලබා 16/05/2023 දින Graphic Design පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වීම. (ල. 1 යි)

(b) Gayni නම් ශිෂ්‍යයාව ශිෂ්‍ය සමාජයේ සාමාජිකත්වය ලබා ගැනීම. (ල. 1 යි)

(iii) (a) ඉහත (ii) (a) කොටසට අදාළ වෙනස්කම් සිදුකිරීමට අදාළ වගුවලට ඇතුලත් කළ යුතු නව රෙකෝඩ (ය) **වගු නාමය** ⟶ **ක්ෂේත්‍රය** 1, ⟶ **ක්ෂේත්‍ර** 2 ........... ආකාරයට ලියා දක්වන්න. (Student_ID එක ST25 ලෙස ගන්න) (ල. 2 යි)

(b) ශිෂ්‍ය සමාජය විසින් Software Developing නම් නව පාඨමාලාවක් (CS05) ආරම්භකර උපරිම සිසුන් 25 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරයි. මෙම පාඨමාලාව සඳහා Nawaz නම් ශිෂ්‍යයා ලියාපදිංචි වන්නේ නම් වෙනස්කම් සිදුකිරීමට අදාළ වගුවලට ඇතුළත් කළ යුතු නව රෙකෝඩ(ය) **වගු නාමය** ⟶ **ක්ෂේත්‍රය** 1, ⟶ **ක්ෂේත්‍ර** 2 ........... ආකාරයට ලියා දක්වන්න. (ල. 2 යි)

(iv) Nawaz නම් ශිෂ්‍යයා විසින් ලියාපදිංචි වී ඇති පාඨමාලා මොනවාද යන්න සෙවීමට විමසුමක් සැකසීම සඳහා සම්බන්ධ කළ යුතු වගු (වගුව) මොනවාද? (ල. 1 යි)

(v) ශිෂ්‍ය වගුව හා පාඨමාලා වගුව අතර පවතින සම්බන්ධතාවය කුමක්ද? (ල.1 යි)

(03) (a) පහත දැක්වෙන ඡේදයේ අදාළ සිද්ධිය හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නිවුන්ගම Supermart සිල්ලර වෙළඳ සැළෙහි කළමණාකාරීත්වය විසින් තම වෙළඳ ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා දැනට පවතින අත්යුරු ගණුදෙනු සැකසුම් පද්ධතිය වෙනුවට පරිගණක පාදක පද්ධතියක් ස්ථාපනය කිරීමට අදහස් කර ඇත. එම කාර්ය IT Solution නම්මෘදුකාංග සමාගමට භාරදුන් අතර එහි කාර්ය මණ්ඩලය අදාළ කාර්ය පහත ආකාරයට ආරම්භ කරන ලදි. 2022 ජනාවාරි මස 22 වෙනි දින එම ආයතනයේ අරුණ සහ සිද්දික් යන නිලධාරින් දෙදෙනා පැමිණ අදාළ ආයතනයේ කටයුතු නිරීක්ෂණය කිරීම සිදු කර අනතුරුව ආයතනයේ කළමණාකාර තුමා හා මුදල් අයකැමි සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්විණි. දින කීපයක් මේ ආකාරයට ආයතනය හා සම්බන්ධ වී අදාළ තොරතුරු එක් රැස් කර තමිලන් යන අයට බාරදුන් අතර ඔහු විසින් පද්ධතිය සැලසුම් කිරීම සිදුකරන ලදි. සදමාලි නම් අය මෘදුකාංගය නිර්මාණය කළ

අතර ඇය විසින්ම ඒකක පරීක්ෂාවද සිදු කරන ලදි. සියළු කාර්යයන් අවසානයේ වෙළඳ සැළෙහි මුදල් අයකැමි මහත්මයෙකු ගෙන්වා අවසන් පරිශීලක ලෙස පරීක්ෂා කිරීමක් සිදු කර අවසානයේ පද්ධතියේ ගැටළු බොහෝ දුරට අවම වී ඇති බව තහවුරු කරගන්නා ලදි. 2023 මාර්තු මස 12 වෙනි දින වෙළඳ ආයතනයට පැමිණි සුධිරන් හා නවීන් සකස් කරන ලද පද්ධතිය ආයතනයේ ස්ථාපනය කළේ දැනට පවතින පද්ධතිය එසේ තිබියදීම ය. මාස දෙකක් පමණ ගතවූ පසු මුදිත නම් අයෙකු පැමිණ පද්ධතියේ සුළු වෙනස්කම් කීපයක් සිදු කරන ලදි.

(i) පද්ධති සංවර්ධන ජීවන චක්‍රය යටතේ නිර්මාණය වී ඇති ඉහත පද්ධතියේ අවශ්‍යතා හඳුනාගැනීම යටතේ තොරතුරු එක්රැස් කිරීම සිදුකර ඇත්තේ කවුරුන් විසින් ද? ඒ සඳහා භාවිතා කර ඇති ක්‍රම ශිල්ප මොනවාද? (ල. 2)

(ii) පද්ධතිය සැලසුම් කිරීමේ කාර්යයේදී තමිලන් විසින් කර ඇතැයි සිතිය හැකි කාර්යයන් 2 ක් ලියන්න. (ල. 1)

(iii) සකස්කළ පද්ධතියේ ඒකක පරීක්ෂාව සදමාලි විසින්ම සිදුකර ඇති අතර වෙළඳ සැලෙහි මුදල් අයකැමි මහත්මයෙකු ගෙන්වන ලද්දේ කුමන පරීක්ෂාවක් සඳහාද? (ල. 1)

(iv) පද්ධතිය පිහිටුවීම සඳහා භාවිතා කර ඇති ශිල්පීය ක්‍රමය කුමක්දැයි දක්වා තවත් එවැනි ශිල්ප ක්‍රම දෙකක් ලියන්න. (ල. 2)

(b) නව පද්ධතියක් සංවර්ධනය කිරීමේ පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ අවස්තා 4 ක් හා ඒ යටතේ සිදුකරන කාර්යයන් 4 ක් දැක්වෙන වගුවක් පහත දැක්වේ. මෙහි A,B,C,D ස්ථාන සඳහා අවශ්‍ය පිළිතුරු පහත ලැයිස්තුවෙන් තෝරා ලේබලය හා පිළිතුර ලෙස ලියන්න. (ල. 4)

| අවස්ථාව | ක්‍රියාකාරකම |
|---|---|
| A | සම්මුඛ සාකච්ඡා |
| පද්ධතිය පරීක්ෂාව | B |
| C | සමාන්තර ස්ථාපනය |
| D | නව පරිශීලක අවශ්‍යතා අනුව පද්ධතිය යාවත්කාලීන කිරීම |

(පද්ධතිය නඩත්තු කිරීම, ප්‍රතිග්‍රහණ පරීක්ෂාව, පද්ධතිය පිහිටුවීම, අවශ්‍යතා හඳුනා ගැනීම.)

(04) පහත දැක්වෙන්නේ Sethmedura පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයේ 2023 අගෝස්තු මස 8 වෙනිදා චැනල් සේවාව සම්බන්ධව හා ලැබුණු ගාස්තු ඇතුලත් පැතුරුම්පතකි. මේ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | SUWA MEDURA MEDICAL CENTRE | | | | | | |
| 2 | Date | 8/8/2023 | | | Center Charges | 20% | |
| 3 | Doc No | Doc Name | No of Pationts | Charges | Total Charges | Centre Charges | Doctor Fees |
| 4 | D102 | Dr. Prasanna Jayakody | 52 | 2,300.00 | 119,600.00 | 23,920.00 | 95,680.00 |
| 5 | D104 | Dr. Hemachandra | 12 | 2,000.00 | 24,000.00 | 4,800.00 | 19,200.00 |
| 6 | D105 | Dr. Kelum Abekoon | 24 | 2,300.00 | 55,200.00 | 11,040.00 | 44,160.00 |
| 7 | D106 | Dr. Ariyasen De Silwa | 61 | 2,300.00 | 140,300.00 | 28,060.00 | 112,240.00 |
| 8 | D107 | Dr. Satharasinghe | 10 | 2,500.00 | 25,000.00 | 5,000.00 | 20,000.00 |
| 9 | D108 | Dr. Nirasha silwa | 63 | 2,300.00 | 144,900.00 | 28,980.00 | 115,920.00 |
| 10 | D109 | Dr. M. Wetakeyawa | 16 | 1,800.00 | 28,800.00 | 5,760.00 | 23,040.00 |
| 11 | | | | | 537,800.00 | 107,560.00 | 430,240.00 |
| 12 | | | | | | | |

(i) (a) Prasanna Jayakody වෛද්‍යවරයාගේ චැනල් සේවාව මගින් ලැබුණු ආදායම E4 කෝෂයේ දැක්වීමට සුදුසු සූත්‍රය ලියා දක්වන්න. (ල. 2)

(b) මෙම සූත්‍රය E8 කෝෂයේ දැක්වෙන ආකාරය ලියන්න. (ල. 1)

(04) (ii) චැනල් සේවාවට පහසුකම් සැපයීම වෙනුවෙන් වෛද්‍යවරයෙකුගෙන් ලැබෙන මුළු ගාස්තුවෙන් 20% ක මුදලක් ආයතන ගාස්තු වශයෙන් අයකරගනු ලබන්නේ නම් F4 කෝෂයේ ආයතන ගාස්තුව සෙවීමට අදාළ සත්‍රය ලියන්න. (අනෙක් වෛද්‍යවරුන්ගේද ආයතන ගාස්තුව සොයාගැනීමට මෙම සූත්‍රය පිටපත් කරගත හැකි විය යුතුය. (ල. 2)

(iii) G4 කෝෂයේ Prasanna වෛද්‍යවරයාගේ ගාස්තුව සෙවීමට භාවිතා කර ඇති සූත්‍රය කුමක්ද? (ල. 2)

(iv) F11 කෝෂයේ ආයතන ගාස්තු වශයෙන් ලැබෙන මුළු මුදල සෙවීම සඳහා අදාළ සූත්‍රය = ශ්‍රිතය 1 (කෝෂය 1 : කෝෂය 2) ආකාරයට ලියා දක්වන්න. (ල. 2)

(v) එක් එක් වෛද්‍යවරයාගෙන් ආයතනයට ලැබෙන ආදායම දැක්වෙන ප්‍රස්ථාරයක් සකස්කරන්නේ නම් ඒ සඳහා ගැලපෙන ප්‍රස්ථාර වර්ගයක් ලියන්න. (ල. 1)

(05) (a) A සිට F දක්වා ලේබල් කර ඇති හිස්තැන් සහිත වගන්ති සලකන්න. එම වගන්තිවල හිස්තැනට ගැලපෙන පදය පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා වගන්ති ලේබලය හා පදය ලියා දක්වන්න. (ල. 6)

(A) වසම්නාමයක් තුළ ඇති ............................... මගින් වෙබ් අඩවිය කුමන කාණ්ඩයට අයත් එකක්දැයි හෝ අයත් රටේ අනන්‍යතාවය විදහා දක්වයි.

(B) අන්තර්ජාලයට සම්බන්ධ කර ඇති උපාංගයක් අනන්‍යව හනාගැනීම සඳහා ............................... භාවිතා කරයි.

(C) අන්තර්ජාලය කළමණාකරණයේදී ............................... මගින් වෙබ් අඩවි හුවමාරු පාලනය කරයි.

(D) කිසියම් විෂයය පථයකට අයත් වූ අන්තර්ජාලය ඔස්සේ ප්‍රවේශ කරගන්නා HTML ලේඛන ගණනාවක එකතුවක් ............................... යැයි කියනු ලැබේ.

(E) URL එක හෝ වසම් නාමය නොදන්නා විට අන්තර්ජාලයේ ඇති යමක් පහසුවෙන් සොයාගැනීමට ............................... භාවිතා කරයි.

(F) ............................... මගින් වසම්නාමයන් IP ලිපින බවට පරිවර්තනය කළ පසු වෙබ් අතරික්සුව විසින් වෙබ් අඩවි ඉල්ලීම සේවාදායකය වෙත යවනු ලබයි.

(වසම් නාම සේවාදායකය, සෙවුම් යන්ත්‍ර, IP ලිපින, ඉහළ මට්ටමේ වසම, වෙබ් අඩවිය, HTTP)

(b) පහත දැක්වෙන්නේ එක්තරා මූල්‍ය ආයතනයක් මගින් යැවීම සඳහා සකස් කරමින් පවතින විද්‍යුත් තැපැල් පණිවුඩයක ආකෘතියකි. මේ ඇසුරෙන් පහත අසා ඇති ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය බව දී ඇති ප්‍රකාශ අංකය සහිතව ලියන්න. (ල. 2 යි)

| | |
|---|---|
| To | saman69@gmail.com, nimal2020@gmail.com |
| Cc | aberatne22@gmail.com, samaranayaka7@gmail.com |
| Bcc | bocmanager@gmail.com, bocinfo@gmail.com |

(i) මෙම විද්‍යුත් තැපැල් පණිවුඩය nimal2020@gmail.com වෙත ද ලැබුණු බව සමන් යන අය දනී. ( )

(ii) මෙම පණිවුඩය bocinfo@gmail.com වෙත ද ලැබුණු බව නිමල් යන අය දනී. ( )

(c) වළාකුළු පරිගණක භාවිතය මගින් සැලසෙන වාසි 2 ක් ලියන්න. (ල. 2 යි)

(06) (a) පාසලේ ශිෂ්‍ය නායකයෙකු ලෙස තෝරාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායකන් අනුව ක්‍රියාකරනු ලබයි.

- පසුගිය ශ්‍රේණි අවසන් වාර පරීක්ෂණ පරීක්ෂණයක ලබාගත් සාමාන්‍ය ලකුණු ප්‍රමාණය 65 ක් හෝ ඊට වඩා වැඩිවීම හෝ
- ක්‍රිඩා සහ විෂයය සමගාමී කටයුතු සඳහා ලබාගත් සහතික පත්‍ර ලකුණු 50 හෝ ඊට වැඩිවීම සහ
- පාසලේ ගුරුභවතුන්ගෙන් ලැබුණු ලකුණු වල සාමාන්‍ය අගය 60 හෝ ඊට වැඩිවීම.


| ශිෂ්‍යයාගේ නම | අවසන් වාර පරීක්ෂණයේ සාමාන්‍ය ලකුණු (Avg_marks) | සහතික පත්‍ර ලකුණු (CF_marks) | ගුරුභවතුන්ගෙන් ලැබුණු ලකුණු (T_marks) |
|---|---|---|---|
| කමල් | 75 | 34 | 63 |
| අංජන | 65 | 52 | 55 |
| පැතුම් | 75 | 86 | 70 |
| විකුම් | 34 | 30 | 60 |

(i) ඉහත වගුවට අනුව ශිෂ්‍ය නායකයින් ලෙස තේරිපත්වන සිසුන්ගේ නම් ලියන්න. (ල. 2 යි)

(ii) ඉහත නිර්ණායක වලට අනුව සකස් කරන ලද ව්‍යාජ කේතය පහත දැක්වේ. එහි P,Q,R,S යන ස්ථාන වලට ගැලපෙන ලේබල් සහිතව ව්‍යාජ කේතය නැවත ලියන්න. (ල. 4 යි)

```
Begin
        Input Avg_marks, CF_marks & (P)
        IF Tmarks>= (Q) then
            If Avg_marks>= 65 then
                Qualified to Prefect
            else
                IF CF_marks>=50 then
                    ..............(R)...........
                else
                    Not Qualified to Prefect
                End IF
            End IF
        else
            .............(S)...........
        End IF
End
```

(b) දාදු කැටයක් 8 වතාවක් උඩ දැමූ පසු ලැබුණු අගයයන් පහත N නම් අරාවක ගබඩා කර ඇත. ඉන් 5 හෝ ඊට වඩා වැඩියෙන් ලැබුණු වාර ගණන සෙවීම සඳහා සකස් කර ඇත. පහත ගැලීම් සටහනේ A, B,C,D ස්ථාන වලට අදාළ ආදේශක ලියන්න (ල. 4 යි)




(07) (a) පහත A සිට D දක්වා ඇති ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් මගින් සිදුකිරීමට බලාපොරොත්තු වෙන කාර්යයන් සිදුකිරීමට යොදාගත හැකි P, Q, R, S ලෙස දක්වා ඇති මෙවලම් හා සසඳා අදාල ඉංග්‍රීසි අක්ෂර යුගලය ලියන්න. (ල. 4 යි)

A ශ්‍රව්‍ය සංඛ්‍යාත කොටසකින් තෝරාගත් කොටස ඉතිරි කර අනෙක් කොටස් ඉවත් කළ හැකිය.

B තෝරාගත් කොටසක් නිශ්ශබ්දව තැබීම.

C ධාවනය වෙන කාලසීමාව වෙනස් කිරීම. (Time Shift)

D අවශ්‍ය ශ්‍රව්‍ය කොටස සලකුණු කිරීම.



| P | Q | R | S |
|---|---|---|---|

(b) අංකිත ග්‍රාෆික සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශයන් සත්‍ය හො අසත්‍ය බව දක්වන්න. (ල. 4 යි)


(i) උසස් නිර්මාණ කාර්යයන් සඳහා බහුලව යොදාගනු ලබන්නේ රාස්ටර් ග්‍රාෆික වලට වඩා වෙක්ටර් ග්‍රාෆික වේ. ( )

(ii) පික්සලයක බිටු 6 ක් මගින් නිරූපණය කළ හැකි උපරිම වර්ණ ගණන 32 කි. ( )

(iii) RGB වර්ණ වල රතු සහ කොළ වර්ණ මිශ්‍ර වී කහ වර්ණය සෑදේ. ( )

(iv) වීඩියෝ සංස්කරණ මෘදුකාංගයක කාල රේඛාව (Timeline) මගින් ග්‍රාෆික දිස්වීමෙහි අනුපිළිවෙල සැකසිය හැකිය. ( )

(c) පහත දැක්වෙන්නේ ද්විමාන සජීවීකරණ මෘදුකාංගයක කාලරේඛාවේ කොටසකි. එහි A,B,C සහ D වලින් දැක්වෙන ලේබල වලට අදාළ අංක පහත ලැයිස්තුවෙන් තෝරා ලේබලය සහ අංගය ලෙස පිළිවෙලින් ලියන්න. (ල. 2 යි)




(Tween frame, Key frame, frame, Blank key frame)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 4 ) | 06. ( 1 ) | 07. ( 1 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. ( 2 ) | 12. ( 2 ) | 13. ( 1 ) | 14. ( 1 ) | 15. ( 1 ) | 16. ( 4 ) | 17. ( 2 ) | 18. ( 2 ) | 19. ( 4 ) | 20. ( 4 ) |
| 21. ( 2 ) | 22. ( 2 ) | 23. ( 3 ) | 24. ( 3 ) | 25. ( 4 ) | 26. ( 2 ) | 27. ( 4 ) | 28. ( 2 ) | 29. ( 3 ) | 30. ( 2 ) |
| 31. ( 2 ) | 32. ( 3 ) | 33. ( 2 ) | 34. ( 3 ) | 35. ( 2 ) | 36. ( 3 ) | 37. ( 2 ) | 38. ( 3 ) | 39. ( 2 ) | 40. ( 4 ) |

(ල. 40)

| | | | |
|---|---|---|---|
| 01 | (i) | ප්‍රමාණය අඩුවීම, කාර්යක්ෂමතාවය වැඩිවීම, ධාරිතාව වැඩිවීම, විදුලිය වැයවීම අඩුවීම | ලකුණු 2 |
| | (i) | (a) රොබෝ තාක්ෂණයෙන් අස්වනු නෙලීම<br>කාලගුණ මිනුම් යන්ත්‍ර, ස්වයංක්‍රීය ජල සැපයුම... ආදි නිවැරදි පිළිතුරු<br>(b) ව්‍යාපාර ලියාපදිංචි කිරීම, බැංකු තොරතුරු, ආයෝජන විස්තර | ලකුණු 1<br>ලකුණු 1 |
| | (iii) | A – VGA, B-USB, C-PS2, D-HDMI | ලකුණු 2 |
| | (iv) | a. $358_{\text{දහය}}$ (පිළිතුර ලබාගත් ආකාරය තිබිය යුතුය)<br>b. $010111111001_{\text{දෙක}}$ (පිළිතුර ලබාගත් ආකාරය තිබිය යුතුය) | ලකුණු 2 |
| | (v) | $\overline{X.Y + Y.\overline{Z}}$ | ලකුණු 2 |
| | (vi) | A – DOS, B- ප්‍රති වෛරස මෘදුකාංග, C-සම්පාදක, D - Linux | ලකුණු 2 |
| | (vii) | A – R, B-P, C-T, D-S | ලකුණු 2 |
| | (viii) | නව පද්ධතියේ දෝෂයක් ඇති වුව ද පැරණි පද්ධතිය තුල දත්ත සුරක්ෂිත වීම<br>පරිශීලකයින් හට නව පද්ධතියට හුරුවීමට කාලයක් ලැබීම | ලකුණු 2 |

(ix)

```
Program program1();
   var n : integer;
begin
   n:=1;
   while n<10 do
      begin
         writeln(n);
         n:=n+1;
      end;
end.
```

හෝ

```
begin
   n:=1;
   while n<10 do
      begin
         writeln(n);
         n:=n+1;
      end;
end.
```

ලකුණු 2

(x)

| # | A9 | 45 | A3 |
|---|---|---|---|

← මෙසේ වෙන් කර දශමය සංඛ්‍යාවට පරිවර්තනය කළ යුතු යි.

RED – 169 GREEN-69 BLUE - 163

ලකුණු 2

| | | | |
|---|---|---|---|
| 02 | (i) | (a) Students වගුවේ Student_ID, Course වගුවේ course_ID<br>(b) Students_Course වගුවේ Student_ID සහ course_ID | ලකුණු 2 |
| | (ii) | (a) Students වගුව සහ Students_Course වගුව<br>(b) Students වගුව | ලකුණු 2 |
| | (iii) | (a) Students වගුව ⟶ ST25, Heshan, 12, True<br>(b) Course වගුව ⟶ CS05, Software Developing, 25 | ලකුණු 2<br>බැගින් 4 කි |
| | (iv) | Students වගුව Course වගුව, Students_Course වගුව | ලකුණු 1 |
| | (v) | බහු - බහු සම්බන්ධතාවය | ලකුණු 1 |

(2) WWW.PastPapers.WiKi (1)

Download Term Test Papers, Short Notes From One Place!

| | | | |
|---|---|---|---|
| 03 | (a)(i) | අරුණ සහ සිද්ධික් නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා | ලකුණු 2 |
| | (ii) | ඇල්ගොරිතම සැකසීම, දත්ත සමුදායන් සැකසීම, අතුරු මුහුණත් සැකසීම ආදී | ලකුණු 1 |
| | (iii) | ප්‍රතිග්‍රහණ පරීක්ෂාව | ලකුණු 1 |
| | (iv) | සමාන්තර පිහිටුවීම, සෘජු පිහිටුවීම, නියමුමය පිහිටුවීම, අදියරමය පිහිටුවීම | ලකුණු 2 |
| | (b) | A – අවශ්‍යතා හඳුනාගැනීම, B - ප්‍රතිග්‍රහණ පරීක්ෂාව, C- පද්ධතිය පිහිටුවීම,<br>D - පද්ධතිය නඩත්තු කිරීම. | ලකුණු 4 |
| 04 | (i) | a. = C4*D4<br>b. = C8*D8 | ලකුණු 2<br>ලකුණු 1 |
| | (ii) | = E4*F$4 හෝ = E4*$F$4 | ලකුණු 2 |
| | (iii) | = E4 - F4 | ලකුණු 2 |
| | (iv) | = SUM (F4:F10) | ලකුණු 2 |
| | (v) | Column Chart (ස්ථම්භ), Bar (තීර ප්‍රස්ථාර/පේළි) Chart, Line Chart (රේඛා ප්‍රස්ථාර) | ලකුණු 1 |
| 05 | (a) | A - ඉහල මට්ටමේ වසම, B – IP ලිපිනය, C – HTTP, D- වෙබ් අඩවියක්,<br>E- සෙවුම් යන්ත්‍ර F – වසම්නාම සේවාදායකය (DNS) | ලකුණු 1<br>බැගින් 6 කි |
| | (b) | (i) සත්‍යයි (ii) අසත්‍යයි | ලකුණු 2 |
| | (c) | ඕනෑම ස්ථානයක සිට වයර් රහිතව තම ගොනු කරා ප්‍රවේශ විය හැකිවීම<br>මෘදුකාංග සඳහා පිරිවැයක් නොවීම<br>පරිගණකයේ ධාරිතාව ඉතිරිවීම<br>කාර්ය සාධනය ඉහළ යාම, මෘදුකාංග යාවත්කාලීන කිරීමට අවශ්‍ය නොවීම | ලකුණු 2 |
| 06 | (i) | කමල්, පැතුම් | ලකුණු 2 |
| | (ii) | P - T_marks , Q – 60, R - Qualified to Prefect, S – Not Qualified to Prefect | ලකුණු 4 |
| | (iii) | A - 0, B – 0, C – 5, D-Display Count / Output count / Print Count | ලකුණු 4 |
| 07 | (a) | A - S, B – R, C – Q, D-P | ලකුණු 4 |
| | (b) | (i) සත්‍යයි (ii) අසත්‍යයි (iii) සත්‍යයි (iv) සත්‍යයි | ලකුණු 4 |
| | (c) | A–Keyframe, B – Tween Frame, C – Blank Keyframe, D-Frame | ලකුණු 2 |

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ශිෂ්‍යත්ව
සුසරි
2014 - 2023
2024
ඉතිහාසය
2013 - 2022
O/L
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න